# සිංහල සංස්කෘතිය පුනර්ජීවනයෙහිලා ධර්මපාල භූමිකාව

**අයි. ආර්. නදීකා සඳමාලි පීරිස්**
සහාය කථිකාචාර්ය සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
*nadeeka.pieris@yahoo.com*

සංස්කෘතිය යනු පුළුල් අර්ථ දෙන සංකල්පයකි. මිනිසාගේ සභ්‍යත්වයට අදාළ දෑ පමණක් නොව පොදු සමාජයෙන් උරුම කර ගත් දේ ද එම සංස්කෘතියට අයත් ය. දැනුම්, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගත් අනෙකුත් කුමන විධියක හෝ පුරුදු හා හැකියාවන් ඇතුළත් සමස්තය සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි ය. මෙම සංස්කෘතිය ආචාර ධර්ම, සිරිත්විරිත් වැනි දේ විවිධ හේතු මත වෙනස් වෙයි. සිංහල සංස්කෘතිය ද එලෙස කලින් කලට වෙනස් වී ඇත. බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ ශීඝ්‍රයෙන් සිදු වෙමින් පැවති බටහිරකරණය හා ක්‍රිස්තියානිකරණය නිසා සිංහල සංස්කෘතිය එසමයෙහි දී ක්‍රමයෙන් විනාශ වුණි. දහනව වන සියවසේ ඇති වූ එම තත්ත්වය නැවත යථා තත්ත්වයට ගනු පිණිස බෞද්ධ ව්‍යාපාර ආරම්භ විය. තත්කාලීන අවශ්‍යතාවට අනුව සිංහල සංස්කෘතිය පුනරුදයට ලක් කිරීමට දහනව වන සියවසේ අග භාගයේ දී උරදුන් ප්‍රබල පුරෝගාමී චරිතය අනගාරික ධර්මපාලතුමා ය. අස්ථාවර ව පැවති අවධියක, ශ්‍රී ලංකා දේශයේ ජාතික, ආගමික සහ සංස්කෘතික ප්‍රබෝධයෙහිලා උත්කෘෂ්ට මෙහෙවරක් කළ එතුමා එවක නිදා සිටි සිංහල ජනතාව අවදි කරමින්, විනාශ වී ගිය ශ්‍රී ලාංකේය සංස්කෘතිය නැවත පුනර්ජීවනයට කටයුතු කර ඇති ආකාරය මෙහිදී විමර්ශනය කෙරේ. එසේ ම සමකාලීන සිංහල සංස්කෘතියට ද අනගාරික ධර්මපාලතුමාගේ චරිතය සහ එතුමාගේ අදහස් අදාළ කර ගත හැකි ද යන්න ද විමර්ශනය කිරීම ද මෙම අධ්‍යයනයේ දී අපේක්ෂිත ය. මෙහි දී අනගාරික ධර්මපාලතුමා සිංහල සංස්කෘතිය උදෙසා ඔහු සතුව පැවති අදහස් මොනවා ද? ඒ සඳහා එතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද? සංස්කෘතිකාංග යථා තත්ත්වයට පත් කරනු සඳහා අන් අය ඇමතීමේ දී සිය භාෂාව භාවිත කළේ කෙසේ ද? යනාදී පර්යේෂණ ප්‍රශ්න පිළිබඳ මෙම අධ්‍යයනයේ දී සාකච්ඡා කරයි. ප්‍රථම ව මාතෘකාවට අදාළ පූර්ව කියවීම් හා අවශ්‍ය න්‍යායික ප්‍රවේශය ලබා ගැනීම මූලික ව සිදු වේ. පුස්තකාල ග්‍රන්ථ හා ලේඛන පරිශීලනය ප්‍රමුඛ වේ. මුද්‍රිත හා අමුද්‍රිත මූලාශ්‍රය පරිහරණය මඟින් ප්‍රාථමික හා ද්විතීයික දත්ත ලබාගැනීම සිදුවේ. අද්‍යතනයේ දී මෙවැනි ජාතික වීරයින් සැමරීම අවශ්‍යව ඇතැයි ද සිතෙයි. එනිසා 'සිංහල සංස්කෘතිය පුනර්ජීවනයෙහිලා ධර්මපාල භූමිකාව'යන අධ්‍යයනය සමකාලීන සිංහල සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කිරීමට සහ බෞද්ධාගමික ප්‍රබෝධය ඇති කරලීමට ඉමහත් දායකත්වයක් වනු ඇත.

මුඛ්‍ය පද : අනගාරික ධර්මපාලතුමා, සිංහල සංස්කෘතිය, පුනර්ජීවන